# බලය බෙදීමට අප විරුද්ධ ඇයි? - II

බලය බෙදීමට අද කෑ මොර ගසන මැති ඇමතිවරුන් නැවතත් රාජ්‍ය නොවන සංවිධාන සමග ක්‍රමයෙන් එකතුවනු පෙනෙන්නට ඇත. අප කලින් ද කියා ඇත්තේ ආණ්ඩුව පවතින්නේ මේ සිංහල විරෝධි මැති ඇමතිවරුන් නිසා නොවන බවත් මැති ඇමතිවරුන්ගේ පැවැත්ම ආණ්ඩුව නිසා තහවුරු වී ඇති බවත් ය. චන්ද්‍රිකාවාදීන්ව සිටි මේ අය අද මහින්දවාදීන් වී ඇත්තේ බලයට ඇති කෑදරකම නිසා මිස රටට ජාතියට වැඩක්කිරීමට ඇති වුවමනාව නිසා නො වේ. මොවුහු මංගල සමරවීරට සමාන ප්‍රතිපත්ති දැරුවත් තවමත් ආණ්ඩුවේ සිටින්නේ තමන්ට දැනට සිටින තත්වයට වඩා වැඩි තත්වයක් වෙනත් ආණ්ඩුවකින් බලාපොරොත්තු විය නොහැකි නිසා ය. මංගල සමරවීර එසේ වඩා හොඳ තත්වයක් බලාපොරොත්තුවෙන් ඊනියා මහජන පිළක් නිර්මාණය කරගත්ත ද ඒ පිළ අද ඔහුට අවමංගලයක් වී ඇත. බලය බෙදීමට පක්ෂ අය නැවතත් අප ජාතිවාදීන් අන්තවාදීන් ලෙස හැඳින්වීමට පටන්ගෙන ඇත. මොවුහු මේ අඬහැරය කොටි පරදවන්න යැයි අප කී විට ද කළ බව අමතක නොකළ යුතු ය. කොටි පැරදවිය හැකි බව හා පැරදවිය යුතු බව අප කී විට මොවුහු එයට සිනහසුණහ. ප්‍රභාකරන් සමග සාම සාකච්ඡා පැවැත්විය යුතු බව කියා සිටියෝ ද මොවුහු ය. ප්‍රභාකරන් සමග සාම සාකච්ඡා නොකර සාමය උදාකරගත නොහැකි යැයි කීවෝ ද මොහු ය. මොවුන් පමණක් නොව ඇතැම් විදේශ අමාත්‍යාංශ නිලධාරීහු ද හිටපු නිලධාරීහු ද, ජඩමාධ්‍යවේදීහු ද, අද ජාතිකත්වයේ කොඩිය ගෙන සිටින ඇතැම් දේශපාලන පක්ෂ නායකයායෝ ද එසේ කීවෝ ය. දැනට අවුරුදු විස්සකට පෙර සටන් මෙහෙයුම් කළ යුතු යැයි ප්‍රසිද්ධියේ කියා සිටි කී දෙනෙක් වෙත් ද?

අද මොවුහු සියළු දෙනාම කොටි පැරදවීම ගැන ප්‍රශංසා කරති. එහෙත් මොවුන් සමහරකු තම සිංහල විරෝධී ස්ථාවරය අත්හැර නැත. ඇතැම්හු එදා චන්ද්‍රිකා කුමාරතුංග සමග ශ්‍රී ල නි පක්ෂය ජාතිකත්වයෙන් විජාතිකත්වයට හැරවීමට මහන්සිගත්හ. එදා ඔවුන්ගේ මූලික ස්ථාවරය වූයේ සිංහල ජාතිය හා ඊනියා සිංහල ආණ්ඩුව විසින් දෙමළ ජනයාට එරෙහිව අසාධාරණ කෙරී ඇති බවත්, වෙල්වනායගම් ඇතුළු පිරිසක් අහිංසාවාදීව ඒ අසාධාරණවලට සාමකාමී විසඳුම් ඉල්ලා සිටි අවස්ථාවේ දී ආණ්ඩුව එයට විරුද්ධව හිංසාකාරීව ප්‍රතිචාර දැක්වූ බවත්, ඒ හේතුවෙන් වෙල්වනායගම් ඉක්මවා ගොස් ප්‍රභාකරන්ට උතුර හා නැගෙනහිර ඊනියා සිංහල ආණ්ඩුවෙන් මුදාගැනීමට ආයුධ අතට ගැනීමට සිදු වූ බවත්, ඊළම නොදී රට දෙකඩ නොකිරීමට නම් සන්ධීය හෝ සහසන්ධීය රාජ්‍යයක් බිහිකර උතුරු හා නැගෙනහිර පළාත්වලට (ඔවුන්ට අනුව උතුරු නැගෙනහිරට) බලය බෙදිය යුතු බවත්, එහි පදනම ඉන්දීය ව්‍යවස්ථාව බවත්, 13 වැනි සංශෝධනය හොඳ ආරම්භයක් බවත් එහෙත් එයට එහා යන බලය බෙදීමක් තිබිය යුතු බවත් ය. වෙනත් වචනවලින් කිවහොත් අද ප්‍රභාකරන් පැරදවූයේ තමන් ලෙස හැසුරුණත් එදා ඔවුහු ප්‍රභාකරන් ඊළමක් පිහිටුවීමට ආයුධ ගත්විට ඒ යුක්ති යුක්ත කළහ. ප්‍රභාකරන්ගේ සියළු මිනීමැරුම්වලට ඔවුහු ද යම් ප්‍රමාණයකට වග කිව යුත්තෝ වෙති.

මේ සිංහල විරෝධී පිරිස් එදාට වඩා අද වෙනස්වන්නේ කොටි පැරදවීම කළ යුතුව පැවති දෙයක් ලෙස හැඳින්වීමෙන් පමණකි. එහෙත් ඔවුහු දෙමළ ජාතිවාදීන්ට සන්ධීය හෝ සහසන්ධීය හෝ කප්පම දීමට බැඳී සිටිති. ඊනියා ජාත්‍යන්තරයේ සහාය මොවුන්ට තවමත් අවශ්‍ය වෙයි. පසුගිය සතියේ නන්ද ගොඩගේ නම් හිටපු තානාපතිවරයකු බලය බෙදා ජාත්‍යන්තරයේ සහාය ලබාගත යුතු යැයි සඳහන්කර තිබුණේ ය. අපි එකක් මතක තබා ගනිමු. ඊනියා ජාත්‍යන්තරය යනු බටහිර රටවල් කිහිපයක් බවත් ඒ රටවලට ඇහුම්කම් නොදී ඔවුන්ගේ සහායක් බලාපොරොත්තුවෙන් වැඩ නොකිරීම නිසා ම අපට කොටි පැරදවීමට හැකි වූ බවත් අමතක නො කරමු. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ද වෙනත් තැන්වල ද ලංකාවට මේ බටහිර රටවල් රොත්ත පරාජය කිරීමට හැකි වූයේ බොරු මහදැනමුත්තන්ගේ දක්ෂකමක් නිසා නොව ආණ්ඩුවේ බටහිර ගැති නොවන විදේශ ප්‍රතිපත්තිය හේතුකොටගෙන ය. කොටි පැරදවීමෙන් පසුව බ්‍රිතානිය ඇතුළු බටහිර රටවල් ක්‍රියාකරන ආකාරය අපි අත්දැකීමෙන් දනිමු. හිටපු තානාපතිවරුන්ට හා බටහිරින් තානාපති සේවය උගත්තවුනට නොහැකි වුව ද දෙමළ ජාතිවාදයේ කිරිමව බ්‍රිතානිය බව දැනගැනීමට අපට හැකිවූයේ අද ඊයේ නො වේ. බටහිර රටවල ඊනියා සහාය දිනාගැනීම සඳහා අපේ ප්‍රතිපත්ති වෙනස් කළ යුතු නො වේ. බොහෝ සිංහල විරෝධීන් ඊනියා සාධාරණත්වයක් ගැන කතාකරන්නේ ඔවුන්ගේ බටහිර ගැති කම ප්‍රදර්ශනය කරමිනි. පසුගිය සතියේ ආණ්ඩුව විසින් කැනඩාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ බොබ් රේ ආපසු යවනු ලැබීම අප ප්‍රීතියෙන් අනුමත කරන්නේ ඔහුගේ කොටි හිතවාදී ප්‍රතිපත්තිය ගැන එරටින් ම ලබාගත්

© Prof. Nalin De Silva

තොරතුරු ද අනුව ය. එහෙත් එහි නො විසඳි ප්‍රශ්නයක් වෙයි. ටොරොන්ටෝ නගරයෙහි වසන ලංකා නියෝජිතවරයාගේ (කොන්සියුලර් ජෙනරල්) තීරණයට පටහැනිව බොබි රේට ලංකාවට පැමිණීමට විසා බලපත්‍රය නිකුත්කෙළේ කාගේ සිතැඟි පරිදි ද?

ඊනියා ජාත්‍යන්තරයේ සහාය ලබාගැනීම සඳහා අප බලය බෙදිය යුතු නො වේ. බලය බෙදිය යුත්තේ එය යම් ප්‍රශ්නයකට විසඳුමක් නම් පමණකි. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම සිදු වී ඇති අසාධාරණය කුමක්දැයි අප අසා දශක දෙකකට ආසන්න ය. එහෙත් ඒ ප්‍රශ්නයට තවමත් කිසිම පඬියකු නිසි පිළිතුරක් දී නැත. එහෙත් සිංහල ජාතියට අපහාස කිරීමට නම් පඬියෝ ද ඇතැම් මැති ඇමතිවරු ද බුරුතු පිටින් ඉදිරිපත් වෙති. පසුගිය සතියේ අප පෙන්වා දුන් ආකාරයට අසූ තුනේ ජූලි කලබල සම්බන්ධයෙන් සිංහල ජාතියට දොස් පවරන පඬියෝ එහි දී දෙමළ ජනයාට උපකාර කළ සිංහල පිරිස් ගැන ජාතියට නොව ඒ පුද්ගලයන්ට ස්තුති කරති. මේ දෙමළ ජාතිවාදීන්ගේ කුහකත්වයට එක් උදාහරණයක් පමණකි. දෙමළ ජනයාට සිංහලය රාජ්‍ය භාෂාව කිරීමෙන් අසාධාරණයක් සු නො වී ය. ඉංගිරිසිය ඉවත්කර සිංහල රාජ්‍ය භාෂාව කිරීමෙන් ඉංගිරිසි නොදත් දෙමළ ජනයාට සිදු වු අසාධාරණය කුමක් ද? ඉන් සිංහල දත් එහෙත් ඉංගිරිසි නොදත් දෙමළ ජනයාට වාසියක් මිස අවාසියක් සිදු නො වේ. මේ ඊනියා අසාධාරණ එකක්වත් අසාධාරණයක් නොවන බව දැනට අවුරුදු පහළොවකට පමණ පෙර ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා යන පෙතෙන් ද පෙන්වා දුන්නෙමු. අවශ්‍ය කෙනෙකුට කාලය වෙබ් අඩවියෙන් මේ පොත නොමිළයේ බාගත හැකි ය. ඒ කෙසේ වෙතත් මේ සියළු ඊනියා අසාධාරණයන් සිදුවීමට පෙර 1949 දී චෙල්වනායගම් වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ අරමුණින් දෙමළ රාජ්‍ය පක්ෂය ආරම්භ කෙළේ ඒ ඊනියා අසාධාරණකම් දිවසින් දැක ද? පඬියන්ගෙන් පිළිතුරු නැති මේ ප්‍රශ්නවලට ශ්‍රී ල නි පක්ෂයේ සිංහල විරෝධී චන්ද්‍රිකාවාදීන්ට පිළිතුරු දිය හැකි ද?

ප්‍රශ්නයේ ආරම්භය ඊනියා අසාධාරණකම් නොව පළමුව ලන්දේසීන්ගේ හා පසුව බ්‍රිතානීන්ගේ අනුග්‍රහයෙන් සිංහලත්වයට හිමි තැන නොදීමට කටයුතු කළ ඉංගිරිසි උගතුන්ගේ දෙමළ ජාතිවාදය බව අප සාධක සහිතව පෙන්වා දී ඇත. මේ ඉංගිරිසි උගත් දෙමළ ජාතිවාදීන්ට මුලින් ම අවශ්‍ය වූයේ බ්‍රිතානීන්ගේ අනුග්‍රහය ඇතිව ලංකාවේ ම නායකයන් බවට පත්වීම ය. 1931 සර්වජන ඡන්දය ලැබෙන තෙක් ම ඉංගිරිසි උගත් දෙමළ ජනයා මෙරට නායකයෝ වූහ. ඔවුන්ට ඒ නායකත්වය අහිමි වූයේ සර්වජන ඡන්දයෙන් පසුව බ්‍රිතානීන් විසින් ම සිංහලයන්ට ලබාදුන් නායකයන් වූ සේනානායකවරුන් හා වෙනත් අය රටේ නායකයන් බවට පත්වීමෙනි.  සර්වජන ඡන්දයෙන් පසුව දෙමළ නායකයන්ට රටේ නායකයන් බවට පත්වීමට නොහැකි බව දුටු පළමු තැනැත්තා වූයේ චෙල්වනායගම් ය. ඔහු වෙන ම රාජ්‍යයක් පිහිටුවාගැනීමට පක්ෂයක් ආරම්භ කෙළේ එබැවිනි. ඉංගිරිසි උගත් දෙමළ ජනයාට පමණක් වෙන ම රාජ්‍යයක් පිහිටුවා ගැනීමට නොහැකි බව දත් ඔහු තම ජාතිවාදී සිංහල විරෝධී ව්‍යාපාරය ඉංගිරිසි නොදත් දෙමළ ජනයා අතරට ද ගෙන ගියේ ය. එය කෙළවර වූයේ ප්‍රභාකරන් ගෙනි. දෙමළ ජාතිවාදයේ සම්භවය හා විකාශය පිළිබඳ සුසමාදර්ශ දෙකක් මත පදනම් වූ මතවාද දෙකක් ඇත. එකක් ඊනියා අසාධාරණකම් මත පදනම් වෙයි. අනෙක බ්‍රිතානිය මැදිහත් වී ඇතිකරන ලද සිංහලත්වයට හිමි තැන නොදෙන දෙමළ ජාතිවාදය ගැන වෙයි. මේ මත දෙක හා සම්බන්ධ සාධක ද ගත්කල සංගතවන්නේ කිනම් මතය ද යන්න පඬියන්ට මෙන් ම ශ්‍රී ල නි පක්ෂයේ ද සිංහල විරෝධී මැති අමැතිවරුන්ට ද තීරණය කළ හැකි ය. බලය බෙදීම විසඳුමක් ලෙස ඉදිරිපත් කෙරෙන්නේ අසාධාරණය මත පදනම් වූ  මතවාදයෙන් පැනනගින්නක් ලෙස ය. ඊනියා අසාධාරණයක් නැතිවා පමණක් නොව  ඒ ඊනියා විසඳුම ද අසංගත ය. දෙමළ ජනයාගෙන් සියයට හැටකට වැඩි ප්‍රමාණයක්  උතුරු හා නැගෙනහිර පළාත්වලින් බැහැරව සිටිය දී ඒ පළාත්වලට බලය බෙදීමෙන් දෙමළ ජනයාගෙන් බහුතරයට සිදු වී ඇතැයි කියන අසාධාරණවලට පිළියම් සොයන්නේ කෙසේ ද? ඒ බහුතරයට වෙන ම විසඳුමක් පසුව ගෙන එන්නේ ද? පඬියන් හා අනෙක් අය මේ ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva